සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022

**11 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව - I** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

<u>උපදෙස් :</u>
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍ය වන ................................................................ ක්‍රියාවලිය සිදුවන්නේ ජෛවගෝලය තුළය. (ප්‍රභාසංශ්ලේෂණ / උත්ස්වේදන / වාෂ්පීකරණය)

02 පෘථිවි ................................................................ හා ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ශිලාගෝලය ලෙස හැඳින්වේ. (කබොල / පහළ ප්‍රාවරණය / හරය)

03 කඳුකර ප්‍රදේශයක පිහිටි උස් සම භූමි ප්‍රදේශ ................................................................ නම් වේ.

(තැනිතලා / සානු / කපොලු)

04 ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනයෙන් 95 % ක්ම සපයනු ලබන්නේ දකුණු හා ...................................... ආසියාතික රටවලිනි. (නැගෙනහිර / නිතිතදිග / අග්නිදිග)

05 ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියෙන් 75% කම දායකත්වය සපයන්නේ ................................................................ අංශය මගිනි. (කෘෂි කාර්මික / කාර්මික / සේවා)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

06 කිසියම් නිෂ්පාදනයකට අවශ්‍ය විවිධ කොටස් විශේෂ ප්‍රාගුණ්‍යය යටතේ විවිධ ස්ථානවල නිපදවා එම කොටස් එක් ස්ථානයකට රැස් කොට භාණ්ඩ සැකසීම එකලස් කිරීමේ කර්මාන්ත යයි. ( නි / වැ )

07 ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උයන පිහිටි ගන්නෝරුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් ය. ( නි / වැ )

08 මූර්ත දළ ජාතික නිෂ්පාදිතය සංවර්ධනය මැනීමේ නූතන මිනුමකි. ( නි / වැ )

09 වාහන දුම් පරීක්ෂාව 1992 පැවති රියෝ සමුළුවෙන් ගන්නා ලද තීරණයකි. ( නි / වැ )

10 ශ්‍රී ලංකා 1 : 50, 000 භූ ලක්ෂණ සිතියම් වල අක්ෂාංශ වටිනාකම්, ඇතුළු මායිම් තීරුව තුළ දක්වා තිබේ. ( නි / වැ )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11 දියළු පස ................................................ වගාව සඳහා වඩාත් යෝග්‍ය වේ.

12 සාගරයේ නොයෙකුත් කම්පන හේතුවෙන් වෙරළ දෙසට ගමන් ගන්නා උස් දිගු සාගර තරංග ................................................ නමින් හඳුන්වයි.

13 විවිධ ආභරණ සෑදීම සඳහා යොදා ගනු ලබන ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා ඛනිජය වන්නේ ................................................ ය.

14 ඇමර්සන් වනාන්තර ප්‍රදේශය ලෝකයේ ජන ................................................ කලාපවලට අයත් වේ.

15 නවීන යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයේ ................................................ ආශ්‍රිත ප්‍රවනතාවයකි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.
EXAMRESULTS.LK

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රස්ථාර සටහන යොදා ගන්න.**

වර්ෂ 2008 සිට 2012 තෙක් කාලය තුළ ශ්‍රී ලංකාවේ වී වගා කළ භූමි ප්‍රමාණය හා වී නිෂ්පාදන ප්‍රමාණය පහත ප්‍රස්තාර සටහනින් දක්වා ඇත.


16 වැඩිම වී නිෂ්පාදනයක් සිදු වූයේ ............................... වසරේ දී ය.

17 අඩු බිම් ප්‍රමාණයක වී වගාකර ඇත්තේ ....................................... වසරේ දී ය.

18 බිම් ප්‍රමාණය මෙන් ම නිෂ්පාදන ප්‍රමාණය ද අවම මට්ටමක පවතින්නේ .................................................. වසරේ දී ය.

19 වගා කළ බිම් ප්‍රමාණය ආසන්න වශයෙන් සමාන අගයක් ගෙන ඇත්තේ 2010 හා ................................. වසර වලය.

**ශ්‍රී ලංකාවේ වී වගා කරන භූමි ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමාණය**




මූලාශය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2013

භූමි ප්‍රමාණය හෙක්ටයාර්

නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන්

- **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල ''අ'' සහ ''ආ'' යනුවෙන් තීරු දෙකක් දක්වේ. ''අ'' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට ''ආ'' තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20

| ''අ'' | ''ආ'' |
|---|---|
| **දූපත** | **පිහිටි මහාද්වීපික තටකය** |
| 1. බෝර්නියෝ | A - ඕස්ට්‍රේලියා |
| 2. තස්මේනියා | B - අප්‍රිකා |
| 3. මැඩගස්කරය | C - යුරෝපා |
| | D - ආසියා |

(1) B, D, C (2) D, A, B (3) C, D, A (4) D, B, A (.........)

21

| ''අ'' | ''ආ'' |
|---|---|
| **පාෂාණ වර්ගය** | **පාෂාණ** |
| 1. ආග්නේය | A - ජිප්සම් |
| 2. අවසාදිත | B - නයිස් |
| 3. විපරීත | C - ග්‍රැනයිට් |
| | D - ඉල්මනයිට් |

(1) C, A, B (2) B, C, D (3) A, C, B (4) A, D, B (.........)

22

| ''අ'' | ''ආ'' |
|---|---|
| **සාගර කොටස** | **සීමාව (දුර)** |
| 1. රාෂ්ට්‍රිය මුහුද | A - නා. සැ. 24 - 200 අතර |
| 2. යාබද මුහුද | B - නා. සැ. 12 - 24 අතර |
| 3. පරම ආර්ථික කලාපය | C - නා. සැ. 120 - 200 අතර |
| | D - නා. සැ. 12 |

(1) B, C, D (2) D, B, C (3) C, B, A (4) D, B, A (.........)

23 ''අ'' ''ආ''

| | ප්‍රදේශය | | අයන් සංචාරක කලාපය |
|---|---|---|---|
| 1. | සීගිරිය | A - | මහ කොළඹ කලාපය |
| 2. | රත්නපුරය | B - | උතුරු ප්‍රදේශය |
| 3. | මීගමුව | C - | පුරාණ නගර |
| | | D - | මධ්‍යම කඳුකරය |

(1) B, C, D (2) D, C, B (3) C, D, A (4) C, B, A (.........)

24 ''අ'' ''ආ''

| | උපද්‍රවය | | බහුලව බලපාන දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 1. | නියඟය | A - | කළුතර |
| 2. | ජල ගැලීම් | B - | හම්බන්තොට |
| 3. | නායයාම් | C - | නුවරඑළිය |
| | | D - | කුරුණෑගල |

(1) B, C, A (2) B, A, C (3) D, A, C (4) D, C, B (.........)

- **අංක 25 සිට 37 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර ඇසුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25 පෘථිවි ස්කන්ධයෙන් $\frac{2}{3}$ ක් පමණ අයත් වන්නේ,

(1) කබොලට ය. (2) ප්‍රාවරණයට ය.

(3) පිටත හරයට ය. (4) ඇතුළත හරයට ය. (.........)

26 විද්‍යුත් උපකරණ නිෂ්පාදනයේ දී වැඩිම දායකත්වයක් දක්වන රට මින් කුමක් ද?

(1) චීනය (2) ඉන්දියාව (3) ජපානය (4) ජර්මනිය (.........)

27 පහත සඳහන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඛනිජය කුමක් ද?

★ පිඟන් ගඩොල් ★ සනීපාරක්ෂක කට්ටල ★ පිඟන් භාණ්ඩ

(1) මිනිරන් (2) කෙඔලින් (3) ඉල්මනයිට් (4) හුණුගල් (.........)

28 ශ්‍රී ලංකාවේ බහුලව භාවිත වන බලශක්ති ප්‍රභවය තෝරන්න.

(1) ගල් අඟුරු (2) පෙට්‍රෝලියම් (3) ජෛව ස්කන්ධ (4) ජලය (.........)

29 ශ්‍රී ලංකා 1 : 50, 000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා මගින් පෙන්නුම් කරන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නිම්නය, ගංගාව, කපොල්ල (2) නෙරුව, ඩෙල්ටාව, මෝය

(3) වනාන්තර, සානුව, කන්ද (4) නිම්නය, කපොල්ල, සානුව (.........)

30 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහය ආශ්‍රිතව දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) වාර්ෂික වර්ධන වේගය පහළ බැසීම යි.

(2) නාගරික ජන සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළයාම යි.

(3) ස්ත්‍රී ජන සංඛ්‍යාව අභිබවා පුරුෂ ජන සංඛ්‍යාව ඉහළ යාමයි.

(4) වියපත් ජන සංඛ්‍යාව වැඩිවීමයි. (.........)

31 ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) අධිවේගී මාර්ග ඉදිකිරීම (2) කසළ කළමණාකරණ වැඩසටහන්

(3) නිවාස සංවර්ධන ව්‍යාපෘති (4) වෙළඳ සංකීර්ණ ඉදිකිරීම (.........)

32 ★ ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්තයකි.
★ අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව.
★ පොලිතීන්, ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය නිපදවයි.

ඉහත ලක්ෂණවලින් සමන්විත කර්මාන්තය වන්නේ,

(1) විද්‍යුත් කර්මාන්තය. (2) පෙට්‍රෝ රසායනික කර්මාන්තය.
(3) එකලස් කිරීමේ කර්මාන්තය. (4) ගෘහ කර්මාන්තය. (.........)

33 පහත A සිට D තෙක් දී ඇති තොරතුරු අතුරෙන් කේතුධර වනාන්තර වලට අයත් ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - උ. අ. $50^0$ - $60^0$ අතර කලාපයේ ව්‍යාප්තව ඇත.
B - වනාන්තර ස්තර කිහිපයකින් යුක්ත ය.
C - ස්ප්‍රෘස්, ෆර්, පොප්ලර් වැනි ශාක ඇත.
D - තද අරටු සහිතය. පත්‍ර පළල්ය.

(1) A හා C ය. (2) A හා D ය. (3) C හා D ය. (4) B හා C ය. (.........)

34 පහත කරුණු අතරින් ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත ආශ්‍රිත ප්‍රවණතාවක් දක්වෙන වරණය තෝරන්න.

(1) මිනිස් ශ්‍රමය සමග නව යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩි වීම.
(2) කුඩා හා ගෘහ කර්මාන්ත වශයෙන් කෙරෙන නිෂ්පාදනයක් වීම.
(3) විවිධ අවශ්‍යතා සඳහා විවිධ මාදිලියේ බෝට්ටු නිපදවීම.
(4) ඒකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ශක්තිමත් වීම. (.........)

35 පහත දක්වෙන උපද්‍රව අතරින් භූ විද්‍යාත්මක උපද්‍රවයක් වන්නේ,

(1) නියඟය (2) නායයාම්
(3) හිමකඳු කඩා වැටීම් (4) සුළිසුළං (.........)

36 සාර්ක් (SAARC) රටවල් අතරින් ඉහළම මානුෂ සංවර්ධනයක් සහිත රට මින් කුමක් ද?

(1) චීනය (2) ඉන්දියාව
(3) ශ්‍රී ලංකාව (4) මාලදිවයින (.........)

37 ● වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම. ● ආහාර පාන සපයා දීම

ඉහත අවස්ථා අයත් වන්නේ ආපදා කළමණාකරණ චක්‍රයේ කුමන අවස්ථාවට ද?

(1) පෙර සූදානම (2) ප්‍රතිචාර දක්වීම
(3) යථා තත්ත්වයට පත් කිරීම (4) අවම කිරීම (.........)

● **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. උපත්
2. ස්වාභාවික වර්ධනය

B - 1. ගෝලීය උණුසුම් වීම
2. විදුලි වාහන

C - 1. පොසිල ඉන්ධන
2. වායුගෝලය

D - 1. පස
2. භෝග වගාව

38 පළමුවැන්නේ වැඩිවීම දෙවැන්න කෙරෙහි අහිතකර ලෙස බලපාන බවට දක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (.........)

39 දෙවැන්නේ ඉහළයාම පළමුවැන්න පාලනය සඳහා හේතු විය හැකි බවට දක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (.........)

40 පළමුවැන්නේ අඩුවීම දෙවැන්නේ ද අඩුවීමට හේතුවිය හැකි බවට දක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (.........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව - II

| නම/ විභාග අංකයඃ |
|---|

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි (අ) , (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1 : 50, 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(i) A අක්ෂයෙන් දක්වා ඇති ජලවහන ලක්ෂණය කුමක් ද?

(නිම්නය / ගංගාව / ගංදඟරය) (ලකුණු 01)

(ii) C - D රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(නෙරුව / කපොල්ල / නිම්නය) (ලකුණු 01)

(iii) E - F රේඛාවෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?

(මද බෑවුම / මොහොර බෑවුම / අවතල බෑවුම) (ලකුණු 01)

(iv) J අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(දේශාංශ අගය / අක්ෂාංශ අගය / ජාතික ඛණ්ඩාංක) (ලකුණු 01)

(v) සිතියම්ගත ප්‍රදේශයේ බහුලව ව්‍යාප්තව ඇති ව්‍යාපාරික භෝගය කුමක් ද? (ලකුණු 01)

(vi) A 10 මාර්ගයේ දිග කිලෝමීටර් වලින් දක්වන්න. (ලකුණු 01)

(vii) G අක්ෂරයෙන් දක්වෙන චතුරස්‍රාකාර ප්‍රදේශයෙහි පිහිටි සංකේත මගින් දක්වා ඇති පොදු සේවා සපයන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් ''නි'' යන්න ද වැරදි නම් ''වැ'' යන්න ද සඳහන් කරන්න.**

(viii) (a) සිතියම්ගත ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයට අයත් වේ.

(b) සිතියම්ගත ප්‍රදේශය උතුරු දෙසට බෑවුම් වේ. (ලකුණු 02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නය ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

    (i) යුක්රේනය - S, T, U

    (ii) මෙක්සිකෝ බොක්ක - I, J, K

    (iii) යැංසි ගඟ - F, G, H

    (iv) මහා බාධක කඳු - C, D, E

    (v) සහරා කාන්තාරය - P, Q, R

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂය තුන අතුරෙන් නිවැරදි පිළිතුරු දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබද ඇති තීරුවේ එක් එක් ප්‍රශ්ණයට අංක ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

    (i) සුළු පොල් ත්‍රිකෝණයට අයත් මිද්දෙණිය - A, B, C

    (ii) මධුපාර අභය භූමිය - I, J, K

    (iii) සිලිකා වැලි නිධිගතව ඇති නාත්තන්ඩිය - P, Q,R

    (iv) මඩකලපුව - D, E, F

    (v) කොඩ්ඩියාර් බොක්ක - S, T, U

## II කොටස


(02) යාබදව දක්වා ඇත්තේ පෘථිවි වායුගෝලයේ සංයුතිය දක්වෙන රූප සටහනකි.

(i) රූප සටහනේ A හ D වලින් දක්වෙන වායු වර්ග දෙක නම් කරන්න. (ල. 02)

(ii) B වලින් දක්වා ඇති වායුවෙන් ලබා ගන්නා ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 03)

(iii) (a) ශිලාගෝලය හා වායුගෝලය අතර ජලය හුවමාරු වන ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද? (ල. 03)

(b) ඉහත ඔබ නම් කළ ක්‍රියාවලියේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ල. 05)



• ප්‍රශ්න අංක 03 සහ 04 ට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සිතියම උපයෝගී කරගන්න.




(03) (i) සිතියමේ A අක්ෂරයෙන් දැක්වෙන තිරිඟු වගා කරන රට ද?

B අක්ෂරයෙන් දැක්වෙන තේ වගා කරන රට ද නම් කරන්න. (ල. 02)

(ii) තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) ලෝක තේ නිෂ්පාදනයේ ප්‍රවණතා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(04) (i) (a) සිතියමේ C අක්ෂරයෙන් දැක්වෙන නැව් තැනීමේ කර්මාන්තය සඳහා වැදගත්වන රට කුමක් ද?


(b) විද්‍යුත් කර්මාන්තයේ දී වැදගත් වන ජපානය දැක්වෙන අක්ෂරය ද නම් කරන්න. (ල. 02)

(ii) විද්‍යුත් කර්මාන්තය යටතේ නිපදවන දෛනික මානව අවශ්‍යතා සඳහා භාවිතා වන විද්‍යුත් භාණ්ඩ තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත ගැටළු දෙකක් සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(05) (i) යාබඳව දක්වා ඇති ශ්‍රී ලංකා සිතියමේ උඩරට තේ වගාව සඳහා වැදගත්වන දිස්ත්‍රික්කය දක්වෙන අක්ෂරය ද, පොල් වගාව සඳහා වැදගත් ව දිස්ත්‍රික්කය දක්වෙන අක්ෂරය ද පිළිවෙලින් ලියන්න. (ල. 02)




(ii) ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය මුහුණපාන ගැටළු එක බැගින් පහත අංශ යටතේ දක්වන්න.

(a) භූමි පරිභෝගය ආශ්‍රිත

(b) නිෂ්පාදනය ආශ්‍රිත

(c) වෙළඳාම ආශ්‍රිත (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කර්මාන්ත වල ඇති වැදගත්කම කරුණු තුනක් මගින් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.(ල. 05)

(06) (i) ශ්‍රී ලංකාවේ භාවිත වන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රදේශවල පිහිටා ඇති විදුලි බලාගාර සඳහා භාවිත කරන ශක්ති ප්‍රභව සඳහන් කරන්න.

(a) නොරොච්චෝලේ

(b) වික්ටෝරියා

(c) බරුතකන්ද (ල. 03)

(iii) (a) බලශක්ති පරිභෝජනයේ දී ශ්‍රී ලංකාව මුහුණු දෙන ගැටළු දෙකක් ලියන්න.

(b) බලශක්ති සංරක්ෂණය සඳහා ඔබට දායක විය හැකි ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(07) (i) සංවර්ධනය මැනීම සඳහා භාවිත කළ පැරණි මිනුම් දෙකක් සඳහන් කරන්න. (ල. 02)


(ii) මානුෂ සංවර්ධන දර්ශකය සකස් කිරීමට යොදාගෙන ඇති නිර්ණායක තුන ලියන්න. (ල. 03)

(iii) තොරතුරු සන්නිවේදන තාක්ෂණය යටතේ අන්තර්ජාල භාවිතයේ වාසි දෙකක් හා අවාසියක් පැහැදිලි කරන්න. (ල. 05)

(08) (i) ගෝලීය උණුසුම ඉහළ යාමට හේතු වන වායු වර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළයාම නිසා ඇතිවන අහිතකර බලපෑම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) දේශගුණ වෙනස්වීම් අවම කර ගැනීම සඳහ අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)




(i)

(ii)


(iii)

(iv)

(v)

/5

01 (ඉ) / (C)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ)(A) /10 + (ආ)(B) /5 + (ඉ)(C) /5 = /20

භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

ශ්‍රේණිය/Grade : ....................

විභාග අංකය
சுட்டெண்
**Index Number** ..........................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) (අ) (A)

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................

(vi) ..........................................................................................

(vii) ..........................................................................................

(viii) (a) ..........................................................................................

(b) ..........................................................................................

10



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රභාසංශ්ලේෂණ | 11 | වී | 21 | 1 | 30 | 4 | 39 | 2 |
| 02 | කබොල | 12 | සුනාමි | 22 | 4 | 31 | 3 | 40 | 1 |
| 03 | සානු | 13 | මැණික් | 23 | 3 | 32 | 2 | | |
| 04 | අග්නිදිග | 14 | හීන / ශූන්‍ය | 24 | 2 | 33 | 1 | | |
| 05 | කාර්මික | 15 | තාක්ෂණය | 25 | 2 | 34 | 1 | | |
| 06 | නි | 16 | 2010 | 26 | 1 | 35 | 2 | | |
| 07 | වැ | 17 | 2009 | 27 | 2 | 36 | 3 | | |
| 08 | වැ | 18 | 2009 | 28 | 3 | 37 | 2 | | |
| 09 | නි | 19 | 2012 | 29 | 4 | 38 | 3 | | |
| 10 | නි | 20 | 2 | | | | | | |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II පත්‍රය

### I - කොටස

(01) (අ) (i) ගංඳහරය (ල. 01)
(ii) කපොල්ල (ල. 01)
(iii) මොහොර (ල. 01)
(iv) දේශාංශ අගය (ල. 01)
(v) පොල් (ල. 01)
(vi) 10 km (ල. 01)
(vii) රෝහල්, තැපැල් කාර්යාලය, පාසල, උසාවිය, හෝටලය (ල. 02)
(viii) (a) නි (b) නි (ල. 02)

(ආ) (i) T
(ii) I
(iii) G
(iv) E
(v) R

(ඉ) (i) B
(ii) I
(iii) R
(iv) D
(v) S

(02) (i) A - නයිට්‍රජන් D - කාබන්ඩයොක්සයිඩ් (ල. 02)
(ii) ඔක්සිජන්
- ★ ජීවීන්ගේ ශ්වසනයට
- ★ විවිධ කර්මාන්ත සඳහා (ලෝහ නිෂ්පාදනයට)
- ★ දහන පෝෂකයක් ලෙස
- ★ කිමිදීමේ ජීව ආධාරක ලෙස
- ★ සබ්මැරීන්, අභ්‍යවකාශ ගමන් සඳහා (ල. 03)

(iii) (a) ජල චක්‍රය
(b) වාෂ්පීකරණය, උත්ස්වේදනය, ඝනීභනය, වර්ෂණය, ආපදාවය, කාන්දුවීම ඇතුළත් වූ ජල චක්‍රයේ ක්‍රියාවලිය විස්තර කිරීම (ල. 05)

(03) (a) A - කැනඩාව B - කෙන්යාව (ල. 02)
(ii)
- ★ ඒක බෝග වගාවක් වීම.
- ★ දියුණු තාක්ෂණික ක්‍රම භාවිතය.
- ★ බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න අඩු වුව ද ජන සංඛ්‍යාව අඩු නිසා ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩි වීම.
- ★ පැතිරුණු වෙළඳපොලක් පැවතීම ආදී (ල. 03)

(iii)
- ★ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා විවිධ තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිතය.
- ★ බීජ තේ වලට වඩා රිකිලි තේ ගස ප්‍රචලිත වීම.
- ★ විවිධ තේ වර්ග වෙළඳපලට ඉදිරිපත් වීම, (කළු තේ, හරිත තේ, සුදු තේ, තේ කැට ආදී)
- ★ විවිධ රසයෙන් හා ඇසුරුම් වලින් යුත් තේ වෙළඳපොළට ඉදිරිපත් වීම (වැනිලා රස, ඇපල් රස, දොඩම් රස ආදී)
- ★ නැගෙනහිර අප්‍රිකානු රටවල් තේ නිෂ්පාදනයට යොමු වීම. (ල. 05)

(04) (i) (a) C - දකුණු කොරියාව (b) F (ල. 02)
(ii) ★ ගුවන්විදුලි යන්ත්‍ර ★ රූපවාහිනී ★ ඉස්ත්‍රික්ක ★ දුරකතන
★ විදුලි පන්දම ★ විදුලි කේතල ආදී (ල. 03)

(iii) (a)
- ★ ආනයන උපාංග මත රඳා පැවතීම.
- ★ තාක්ෂණය වේගයෙන් වෙනස්වීම නිසා කෙටි කාලයක දී ඒවා යල් පැනීම.
- ★ පරිසරයට ඝන අපද්‍රව්‍ය එකතු වීම නිසා සිදුවන පරිසර හානිය.
- ★ ජංගම දුරකතන වැනි විද්‍යුත් උපකරණ නිසා සෞඛ්‍ය ගැටළු මතු වීම ආදී

(b)
- ★ ඍජු හා වක්‍ර රැකියා බිහිවීම.
- ★ විශේෂඥ ශ්‍රමිකයන් බිහිකිරීම සඳහා උසස් අධ්‍යාපන පාඨමාලා සකස් වීම.
- ★ විද්‍යුත් උපකරණ අලුත්වැඩියා හා සේවා මධ්‍යස්ථාන බහුල වීම.
- ★ එකලස් කිරීමේ කර්මාන්ත නාගරික ප්‍රදේශ වල ඒකාරාශී වීම. (ල. 05)

(05) (i) ★ උඩරට තේ වගාව - B ★ පොල් වගාව - C (ල. 02)

(ii) (a) භූමි පරිභෝජනය - ඉඩම් හිඟය / ඉඩම් කැබලි වීම / ඉඩම් ගොඩ කිරීම

(b) නිෂ්පාදනය - අස්වැන්න අඩු වීම / ජල හිඟය / පොහොර මිල ඉහල යාම

(c) වෙළඳාම - මිල උච්චාවචනය / අතර මැදියන්ගේ ග්‍රහණය / ආදේශක වලින් එල්ලවන තරඟය ආදී (ල. 03)

(iii)
- ★ ද. දේ. නිෂ්පාදනයට 11 . 1 % ක දායකත්වය
- ★ අපනයන ආදායමෙන් 24 % ක් හිමිකර ගැනීම
- ★ ශ්‍රම බලකායෙන් 31 % ට රැකියා ලැබී තිබීම
- ★ වැඩි බිම් ප්‍රමාණයක් යොදවා තිබීම.
- ★ කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයීම (ප්‍රතිශතයක් අවශ්‍ය නැත.) (ල. 05)

(06) (i) ★ සූර්ය ශක්තිය ★ සුළං ★ ජලය (ල. 02)

(ii) (a) ගල්අඟුරු (b) ජලය (c) සූර්ය ශක්තිය (ල. 03)

(iii) (a)
- ★ පිරිවැය අධික වීම. ★ ඛනිජ තෙල් ආනයනයට විශාල මුදල් වැය වීම.
- ★ නාස්තිය හා අපතේයාම ★ ස්වභාවික ආපදා මගින් හානි සිදුවීම ආදී.

(b)
- ★ වැඩි වැඩ කොටසක් දහවල් කාලය තුළ සිදු කර ගැනීම.
- ★ අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම.
- ★ එකවර රෙදි මැද ගැනීම ආදී .... (ල. 05)

(07) (i) ★ මූර්ත ද. ජා. නි. ★ ප්‍රතිශීර්ෂ ද. ජා. නි. ★ ද. ජා. නි. වර්ධන වේගය (ල. 02)

(ii)
- ★ උපතේ දී ආයු අපේක්ෂාව ★ සාක්ෂරතාව
- ★ ක්‍රය ශක්තිය මත ගැලපූ ඒක පුද්ගල ද. ජා. නි. (ල. 03)

(iii) වාසි -
- ★ සම්බන්ධතා වැඩි දියුණු වීම ★ ඍජු හා වක්‍ර රැකියා බිහිවීම.
- ★ අධ්‍යාපනයට නව මංපෙත් හෙළිවීම ආදී (ල. 05)

අවාසි -
- ★ වියදම් අධිකය ★ අනවශ්‍ය තොරතුරු ගලා ඒම
- ★ සංස්කෘතික හානි සිදු වීම ★ සෞඛ්‍ය ගැටළු ආදී .... (ල. 05)

(08) (i) ★ කාබොන්ඩයොක්සයිඩ් ★ මීතේන් ★ CFC ★ නයිට්‍රස් ඔක්සයිඩ් (ල. 02)

(ii)
- ★ දේශගුණ වෙනස්වීම් ඇති වීම. ★ ධ්‍රැව අයිස් දියවී මුහුදු මට්ටම ඉහළ යාම
- ★ කලපු විනාශ වීම හා ජලය ලවණීකරණය වීම.
- ★ සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වී ජලජ ජීවීන් විනාශ වීම.
- ★ ඇතැම් ජීවීන් වඳවීම හා නව ගහන බිහිවීම ආදී. (ල. 03)

(iii)
- ★ පුනර්ජනනීය බලශක්ති භාවිතය දිරිගැන්වීම.
- ★ හරිතාගාර වායු පිටකරන බලශකිත් ප්‍රභව භාවිතය අවම කිරීම.
- ★ රසායනික පොහොර වෙනුවට ජෛවීය පොහොර භාවිතය.
- ★ ඝන අපද්‍රව්‍ය කළමණාකරණය.
- ★ වන වගාවන් ව්‍යාප්ත කිරීම.
- ★ මිශ්‍ර භෝග, බහු භෝග වගාව හඳුන්වා දීම.
- ★ පොදු ප්‍රවාහන සේවා භාවිතය (ල. 05)